**රිදීගම ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රිදීගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, , ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රිදීගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති

විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

- හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.8,209,540 ක් වූ කැප්පිටිගල සතිපොළ ගොඩනැගිල්ල 2023 මාර්තු 17 දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට භාර දී තිබූ නමුත්, එම වටිනාකම ගොඩනැගිලි වටිනාකමෙන් ඉවත් කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු.395,000 ක් වූ කොන්ක්‍රීට් මිශ්‍රණය වෙනත් තොග යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ වැඩ නිමකර ගෙවීම් සිදු කර තිබූ කර්මාන්ත 09 ක් වෙනුවෙන් ගෙවූ රු.174,280 ක් වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | ඉන්ධන තැන්පත් වටිනාකම රු.300,000 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආයෝජන යටතේ දක්වා තිබුණි. | ජංගම වත්කම් යටතේ තැන්පත් වල ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් වී නොමැති නඩු 06 කට අදාලව සමාලෝචිත වර්ෂය තුළ රු.158,680 ක් ගෙවා ඇතත් පවත්නා නඩු සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පවත්නා නඩු සම්බන්ධ හෙළිදරව්වක් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.3 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.2,715,257 ක් වූ ගිණුම් විෂයන් 02 කට අදාල ශේෂයන් හා උප ලේඛනයේ දැක්වෙන ශේෂයන් අතර රු.401,933ක වෙනසක් විය. | උපලේඛන නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂ හා උපලේඛන වල ශේෂ සමාන අගයක් ගත යුතුය. |

### 1.6.4 විගණනය සදහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 ක රු. 41,603,670 කට අදාළව සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය/ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | කඩිනමින් සොයා බලා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ශේෂ සනාථ කිරීමට අදාල පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 1646 | වාහන 12ක ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ, ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන්, විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාවට අයත් වාහන 07 ක ඉන්ධන පරීක්ෂාවක් කර නොතිබුණි. | ඉතාමත් කඩිනමින් සිදුකරන බව. | අදාළ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 2002 පෙබරවාරි 23 දිනැති අංක 01/2002 දරන චක්‍රලේඛ | සභාව සතු වාහනවල ආයතනයේ නම සමඟ රාජ්‍ය ලාංඡනය සලකුණු කර නොතිබුණි. | ඉතාමත් කඩිනමින් සිදුකර විගණනය වෙත ඉදිරිපත් කරන බව. | අදාළ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2019 ජනවාරි 10 දිනැති අංක 2019/02 දරන චක්‍රලේඛයේ 02 වගන්තිය හා 20 වගන්තිය | කඩ කාමර හිමියන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,698,000ක එක්වන් මුදල් අය කරගෙන නොතිබුණි. | හිඟ මුදල අයකර ගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | හිඟ මුදල අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1980 අංක 47 දරණ ජාතික පරිසර පනතේ 06 වගන්තියේ (ආ) හා (ඇ) ප්‍රකාරව | 2023 වර්ෂයේදී අලුත්කළ යුතු වාර්ෂික පරිසර ආරක්ෂණ බලපත්‍ර 151 ක් අලුත්කර එම ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සභාව විසින් ඉටුකර නොතිබුණි. | බලපත්‍රය අලුත් කරගෙන නොමැති කර්මාන්තකරුවන් වෙත ඒවා අලුත් කර ගන්නා ලෙස දැනුම් දී ඇති බව. | එම ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,011,179 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,460,953 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 5,562 | 3,549 | 3,430 | 2,761 | 4,753 | 4,910 | 5,304 | 3,170 |
| කුලී | 6,070 | 5,619 | 5,521 | 1,184 | 6,415 | 5,427 | 5,624 | 918 |
| බලපත්‍ර ගාස්තු | 733 | 654 | 654 | - | 1,092 | 604 | 604 | - |
| වෙනත් ආදායම් | 32,000 | 32,000 | 34,304 | 38,696 | 20,500 | 20,500 | 17,930 | 21,200 |
| එකතුව | 44,365 | 41,822 | 43,909 | 42,641 | 32,760 | 31,441 | 29,462 | 25,288 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශය තුළ පිහිටි වරිපනම් ඒකක 1,167 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ වරිපනම් රු.2,570,173 ක් පැවතුණි. ඉන් වර්ෂ 05 ඉක්මවූ ශේෂය රු.875,433 ක් විය. | හිඟ මුදල අය කර ගැනීමට 2024 වර්ෂයේ දී දේපල තහනම් කිරීමේ වැඩසටහන් හා ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවුරුදු 05 ට වඩා කාලයක සිට අයවිය යුතු අක්කර බදු රු.161,412 ක ශේෂයක් විය. | හිඟ ශේෂයන්ට අදාළ ඉඩම් හඳුනාගෙන ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගැනීම සඳහා මේ වන විට සමීක්ෂණයක් සිදු කරමින් පවතින බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර 18 කින් අයවිය යුතු කඩ කාමර කුලී හිඟය වන රු.856,821 ක් වූ අතර ඉන් වසර 05 ක් ඉක්මවූ ශේෂය රු.384,009 ක් විය. | අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ සහ මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,303,670ක් හා රු.40,000,000ක් විය. | කඩිනමින් එම මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමටත් ඒ අනුව ගිණුම් නිරවුල් කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි අයදුම්පත්‍ර 47 ක් ලැබී තිබුණු අතර ඉන් අයදුම්පත්‍ර 20 කට මාසයක සිට වර්ෂ 01 ත් දින 13 ක් දක්වා කාල ප්‍රමාදයක් සහිතව අවසර පත්‍ර නිකුත් කර තිබුණි. | ඉදිරියේදී එම අඩුපාඩු මගහරවාගෙන කටයුතු කරන බව . | වරිපනම් බල ප්‍රදේශ සඳහා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම කාල ප්‍රමාදයකින් තොරව කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු කඩ කාමර 24ක් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ නව තක්සේරු වටිනාකම් අනුව ගිවිසුම් අලුත් නොකර පැරණි තක්සේරු වටිනාකම් යටතේම පවත්වාගෙන ගොස් තිබුණි. | නව තක්සේරු වටිනාකම අනුව ගිවිසුම් ගත වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | නව තක්සේරු වටිනාකම් අනුව කඩ කුලී අයකර ගැනීමටත් ඒ අනුව කඩ හිමියන් සමඟ ගිවිසුම් ගත වීමටත් කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කැබ් රථයක හා ට්‍රේලරයක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 මාර්තු 27 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පවත්වනු ලබන විශේෂ වාහන පවරා ගැනීමේ වැඩසටහන මඟින් මෙම වාහනය පවරා දීමට අදාළ කටයුතු කළ බව. | අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් භාවිතයට ගෙන තිබූ ඉඩම් 05 ක් පවරාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අදාල ක්‍රියාමාර්ග සිදුකරමින් පවතින බව. | 1947 අංක 08 දරණ රාජ්‍ය සන්ත ඉඩම් ආඥා පනතේ 2.4.1 වගන්තිය අනුව කටයුතු කර පවරා ගැනීමට |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු.214,700 ක් ගෙවමින් මිලදී ගත් ඇඹිලි සළකුණු යන්ත්‍ර 2 සඳහා සහ රු.159,000 ක් ගෙවමින් මිලදී ගත් වීවී ලාම්පු 100ක් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 අනුව පිරිවිතර නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුවක්ද පත් කර නොතිබුණි. | ඉදිරියේදී එවන් මිලදී ගැනීම් සඳහා අදාල පිරිවිතර සකස් කිරීමට කටයුතු සිදු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුගතව කටයුතු කළ යුතුය. |

### 3.5. නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරනැගුම ව්‍යාපෘතියෙන් රු.44,047,815 ක අරමුදල් යොදවා බිම මහල හා තවත් මහල් දෙකකින් යුතුව අර්ධ වශයෙන් නිම කරන ලද රිදීගම බස් නැවතුම්පල හා බහුකාර්ය ගොඩනැගිල්ල 2017 වර්ෂයේදී පවරා දී තිබුණද, අර්ධ වශයෙන් නිම කරන ලද බස්නැවතුම්පල හා බහුකාර්ය ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වීමෙන් ඒ සඳහා දරන ලද රු. 5,526,914 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ව්‍යාපෘතියේ ඉදි කිරීම් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීම තුළින් ප්‍රයෝජනයට ගැනීමට නොහැකිව දරන ලද පිරිවැය නිශ්කාර්ය වී තිබූ බව. | ඉදිකිරීම් සම්පූර්ණ කර ආදායම් උත්පාදන කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු ගල් රෝල හා මිට්ෂුබිෂි කැබ් රථය අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියාව සිදු කිරීමට යොමුකර ඇති බව දන්වන අතර ගල් රෝල අළුත්වැඩියා කිරීම ඵලදායි නොවන බව. | අපහරණ කළ යුතු වාහන කඩිනමින් අපහරණය කිරීම හා අළුත්වැඩියා කර පාවිච්චියට ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල නිකුත් කර තිබූ විගණන විමසුම් සංඛ්‍යාව 01 ක් පමණක් වූයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර විගණන රාජකාරි වලට අමතරව පුරෝකථන වාර්තා සැකසීමේ කාර්යයද අභ්‍යන්තර විගණන නිලධාරීනියට පවරා තිබුණි. | අභ්‍යන්තර විගණනය ප්‍රමාණවත් පරිදි සිදු කිරීමට කටයුතු කර ඇති බව. | සියළුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදු කර විගණන වාර්තා ඉදිරිපත් කළ යුතුය. |